## කිතුනු ගී

### 322 – රොනට වදින

රොනට වදින බිඟු ඔබයි – කැකුළු මල මමයි
මලට සුවඳ ටික ඔබයි – සිඟිති පෙති මමයි

ජේසු දෙවියනී, ජේසු දෙවියනී

විලට වසින පිණි ඔබයි – පද්මිනිය මමයි
සුළඟ සලන සිරි ඔබයි – ලලිතිනිය මමයි

පහන් දොරට හිරු ඔබයි – කුමුදිනිය මමයි
රෑයට දිලෙන හඳ ඔබයි – හඳට රෑය මමයි

දියට මුහුද දෙව් ඔබයි – ගලන ගඟ මමයි
දිගත පතල ජල ඔබයි – නගින රළ මමයි